**සැ. යු.** : i. 2025.05.23 වැනි දින පළ කරන ලද අංක 2438 ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.
ii. මෙවර පළවන ගැසට් පත්‍රයේ IV කොටසේ ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක්, සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,439 - 2025 මැයි මස 30 වැනි සිකුරාදා - 2025.05.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 912 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 917 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජූනි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූනි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

909- B 082685 — 5,403 (2025/05)
F 1 -

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිව වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

භාණ්ඩ භාර ගැනීමේ සහායක ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025 ජුනි මස 20 වැනි** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

**භාණ්ඩ භාරගැනීමේ සහායක තනතුර (පුරප්පාඩු මුළු තනතුරු සංඛ්‍යාව 04)**

1. **වැටුප් පරිමාණය -** 2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය
**රු. 42,290 -9x490/10x540/6x590- රු. 55,640 වේ.** (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 80,000/- පමණ වේ).

2. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

3. **අධ්‍යාපන සුදුසුකම් -**
සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ද, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

4. **වෘත්තීය සුදුසුකම් -**
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක මාස 05කට නොඅඩු මූලික සූපවේදී පාඨමාලාව / මූලික ආහාරපාන පාඨමාලාව හදාරා සහතිකයක් ලබා තිබීම ;

*හෝ*

සූපවේදී හෝ ආහාරපාන සේවා ක්ෂේත්‍රයේ NVQ II සහතිකයක් ලබා තිබීම.

5. **පළපුරුද්ද -**
ඉහත (3) සහ (4) හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පංතියේ හෝටලයක/ පිළිගත් ආයතනයක භාණ්ඩ භාරගැනීමේ සහායක/ මුළුතැන්ගෙයි සහායක/ භෝජනාගාර සහායක ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

6. **බඳවා ගැනීමේ ක්‍රමය -** ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

7. **පරීක්ෂණ පටිපාටිය -**
පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මගින් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

   (අ) ප්‍රායෝගික පරීක්ෂණය :
   ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් හදාරා ඇති පාඨමාලාවට අනුව, මුළුතැන්ගේ සහ ආහාර පාන යන කාණ්ඩ යටතේ අයදුම්කරුවන් පරීක්ෂා කර බලනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

   (ආ) සම්මුඛ පරීක්ෂණය :
   ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලකුණු 40 කට ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

| අනු. අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

8. සේවා නියමයන් හා කොන්දේසි:-

(i) මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

9. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,

(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,

(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

10. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

11. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*වැ. බ.*) පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ,
2025 මැයි මස 27 වැනි දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම්පත්‍රය

**භාණ්ඩ භාරගැනීමේ සහායක තනතුර**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................
..........................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ........................................................
..........................................................................................
..........................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (Mr./Mrs./Miss).
..........................................................................................
..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

03. (අ) පෞද්ගලික ලිපිනය : ..........................................................................
..........................................................................................
..........................................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ආ) කාර්යාලයීය ලිපිනය : ..........................................................................
..........................................................................................
..........................................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය: ...................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු........ මාස........ දින........

05. විවාහක/අවිවාහක බව : (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව: ( ඔව් / නැත )

08. අධ්‍යාපන සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස. (සා/පෙළ) විභාගය

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| පාඨමාලාව | ආයතනය | බල පැවැත්වෙන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. පළපුරුද්ද: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර:-
   (අ) ආයතනයේ නම හා ලිපිනය: ....................................................................................
   (ආ) මුල් පත්වීමේ දිනය: ...............................................................................................
   (ඇ) දැනට දරන තනතුර: .................................................................................................
   (ඈ) මාසික මූලික වැටුප: ...............................................................................................
   (ඉ) දීමනා: ........................................................................................................................
   (ඊ) දළ වැටුප: ..................................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ( ඔව් / නැත )
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. .........................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ( ඔව් / නැත )
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
..................................................................................................................................

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :.............................. ....................................................,
අයදුම්කරුගේ අත්සන.

---

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය
(රාජ්‍ය ආයතනවල/පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .......................................... තනතුර දරන, .................................................... මයා / මිය / මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : .............................. ....................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

05-245

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 (2025)**

01. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 සැප්තැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 ජුනි මස 30 දින වේ.**

**සටහන** - මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 ජුනි මස 02** වැනි දින පෙ.ව. **9.00ට විවෘත** වන අතර **2025 ජුනි මස 30** වැනි දින **ප.ව. 9.00ට අවසන් වේ.**

මෙම විභාගය උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතුය.

02. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03. (අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඉ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු**. 48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 –** රු**. 82,800/-** ක්

වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරියා යටත් විය යුතුය.

06. සුදුසුකම් : කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.06.30 දිනට හෝ ඊට පෙර හා 1995.06.30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයකු ම රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

1. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියලුම විෂයයන්ගෙන් එකවර සමත්ව තිබීම.

**සටහන -**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යය වේ.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සමාන, වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබාගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබා දීම සඳහා අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ අධ්‍යාපන ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් තහවුරු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලැබේ.

**සැලකිය යුතුයි - සෑම අයදුම්කරුවකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025 ජුනි මස 30 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

07. **දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :** දිස්ත්‍රික් නාම ලේඛනය, උපලේඛනය - I ලෙස දක්වා ඇත. අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - I අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී නිවැරදිව සඳහන් කළ යුතුය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරනු ලැබේ.

III. විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

**සැලකිය යුතුයි - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු ප්‍රමාණය වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතු වේ.**

(ආ) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය:

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය;

*එසේ නැතහොත්*

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතුය;

*එසේ නැතහොත්*

III. ඔහු/ඇය නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

**සටහන -**

1. ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත් වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

    I. උප්පැන්න සහතිකය,
    II. ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාම ලේඛනය,
    III. ශිෂ්‍ය කාර්ය දර්ශනය.

2. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයක නිරත වන බව සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.)

3. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 07(ආ) හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරාගත් පසු එය නැවත වෙනස් කළ නොහැක.

08. මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා

වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

**සටහන** - මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතු ය.**

09. විභාග පරිපාටිය :-

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | පැය 02 1/2 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | පැය 01 |

(01) **භාෂා හැකියාව :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

(02) **අභියෝග්‍යතාවය :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන :-** රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඇ) **විභාග ප්‍රතිඵල** - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය මගින් සිදුකෙරෙනු ඇත.

**10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

**11.** විභාග කොන්දේසි

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. **සිංහලෙන් හෝ දෙමළෙන් සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දී ඇති කොටස් පමණක් නිවැරදිව එම භාෂාවලින් සම්පූර්ණ කළ යුතු වේ.** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

**සටහන :** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iii) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(iv) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(v) අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(vii) අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් ද දැනුවත් කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම තොරතුරු සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත සහ විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ix) විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ

නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(x) විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**12. විභාගයට ඇතුළත් කර ගැනීම**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

**සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

**13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 මැයි මස 20 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

උපලේඛනය - I

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වවුනියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොනරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

උපලේඛනය - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 01 | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |
| | | හැව්ලොක් ටවුම | 06 |
| | | නුගේගොඩ | 07 |
| | | මොරටුව | 08 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | පිළියන්දල | 09 |
| | | හෝමාගම | 10 |
| | | මහරගම | 11 |
| | | හංවැල්ල | 12 |
| | | අවිස්සාවේල්ල | 13 |
| 02 | ගම්පහ | මීගමුව | 14 |
| | | මිනුවන්ගොඩ | 15 |
| | | දිවුලපිටිය | 16 |
| | | වේයන්ගොඩ | 17 |
| | | ගම්පහ | 18 |
| | | ජාඇල | 19 |
| | | වත්තල | 20 |
| | | කැලණිය | 21 |
| | | දොම්පෙ | 22 |
| 03 | කළුතර | හොරණ | 23 |
| | | පානදුර | 24 |
| | | කළුතර | 25 |
| | | මතුගම | 26 |
| | | අලුත්ගම | 27 |
| 04 | මාතලේ | මාතලේ | 28 |
| | | ගලේවෙල | 29 |
| | | නාඋල | 30 |
| | | ලග්ගල - පල්ලේගම | 31 |
| 05 | මහනුවර | මහනුවර | 32 |
| | | කටුගස්තොට | 33 |
| | | තෙල්දෙණිය | 34 |
| | | වත්තේගම | 35 |
| | | නුගවෙල | 36 |
| | | ගලගෙදර | 37 |
| | | ගම්පොළ | 38 |
| 06 | නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | | නුවරඑළිය | 40 |
| | | වතුමුල්ල | 41 |
| | | හැටන් | 42 |
| | | ගිනිගත්හේන | 43 |

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 07 | ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | | ගාල්ල | 45 |
| | | බද්දේගම | 46 |
| 08 | මාතර | වැලිගම | 47 |
| | | මාතර | 48 |
| | | කඹුරුපිටිය | 49 |
| | | හක්මන | 50 |
| | | දෙයියන්දර | 51 |
| | | දික්වැල්ල | 52 |
| | | අකුරැස්ස | 53 |
| | | කොටපොල | 54 |
| 09 | හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | | වලස්මුල්ල | 56 |
| | | වීරකැටිය | 57 |
| | | තංගල්ල | 58 |
| | | අම්බලන්තොට | 59 |
| | | හම්බන්තොට | 60 |
| | | තිස්සමහාරාමය | 61 |
| 10 | යාපනය | වාවකච්චේරිය | 62 |
| | | යාපනය | 63 |
| | | තෙලිප්පල්ලෙයි | 64 |
| | | පේදුරුතුඩුව | 65 |
| 11 | මන්නාරම | මන්නාරම | 66 |
| | | මුරුක්කන් | 67 |
| 12 | මුලතිවු | මුලතිවු | 68 |
| 13 | වවුනියාව | වවුනියාව | 69 |
| 14 | ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | | ත්‍රිකුණාමලය | 71 |
| | | මුතූර් | 72 |
| | | පදවි පරාක්‍රමපුර | 73 |
| | | කින්නියා | 74 |
| 15 | මඩකලපුව | මඩකලපුව | 75 |
| | | එරාවූර් | 76 |
| | | කාතන්කුඩි | 77 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 16 | අම්පාර | අම්පාර | 78 |
| | | සේරංකඩ | 79 |
| | | කල්මුණේ | 80 |
| | | අක්කරපත්තු | 81 |
| | | සමන්තුරේ | 82 |
| 17 | පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | | මාදම්පෙ | 84 |
| | | හලාවත | 85 |
| | | පුත්තලම | 86 |
| 18 | කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | | බිංගිරිය | 88 |
| | | නාරම්මල | 89 |
| | | පොල්ගහවෙල | 90 |
| | | කුරුණෑගල | 91 |
| | | ඉබ්බාගමුව | 92 |
| | | දොඩම්ගස්ලන්ද | 93 |
| | | මොරතිහ | 94 |
| | | නිකවැරටිය | 95 |
| | | මහව | 96 |
| 19 | අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | | කැකිරාව | 98 |
| | | අනුරාධපුරය | 99 |
| | | ගලෙන්බිඳුණුවැව | 100 |
| | | කහටගස්දිගිලිය | 101 |
| 20 | පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | | හිඟුරක්ගොඩ | 103 |
| 21 | බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | | වැලිමඩ | 105 |
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 22 | මොනරාගල | බිබිල<br>මොනරාගල<br>වැල්ලවාය | 111<br>112<br>113 |
| 23 | කෑගල්ල | කෑගල්ල<br>රඹුක්කන<br>මාවනැල්ල<br>රුවන්වැල්ල | 114<br>115<br>116<br>117 |
| 24 | රත්නපුර | ඇහැලියගොඩ<br>රත්නපුර<br>පැල්මඩුල්ල<br>බලංගොඩ<br>කලවාන<br>ඇඹිලිපිටිය | 118<br>119<br>120<br>121<br>122<br>123 |
| 25 | කිලිනොච්චිය | කිලිනොච්චිය<br>පලෙයි | 124<br>125 |

05-183

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ විවෘත තරග විභාගය - 2025

Open competitive Examination for the enrollment of students for the National Diploma in Agricultural Production Technology in Sri Lanka Schools of Agriculture - 2025

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හි පැවැත්වෙන "කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5)" හැදෑරීම සඳහා 2026/ 2027 අධ්‍යයන වර්ෂයට අදාළව සිසුන් ඇතුළත් කර ගැනීමේ තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් **2025 ඔක්තෝබර් මාසය** තුළ දී **සිංහල හා දෙමළ** මාධ්‍යයවලින් ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථාන වල දී පැවැත්වීමට අපේක්ෂිතය.

**02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක්වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ level 5) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, බිබිල, ලබුදුව, පාලමුණේ, පරන්තන්, වාරියපොල යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශ්වයට ම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 1 ½ කි. එයින් වසරක කාලයක් කෘෂිකර්ම විද්‍යාලයක් තුල දී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබා ගත යුතුවේ.

2.4 පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුලත් කරගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබුවන්ගේ සුදුසුකම් වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

2.6 පාඨමාලාව සඳහා අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත හා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පාඨමාලාවක් හදාරා ලබා ගත් සුදුසුකම් මත ඉල්ලුම් කල හැකිය.

**03. පාඨමාලාවට ඇතුලත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :**

3.1 අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා -

*3.1.1 අධ්‍යාපන සුදුසුකම්* :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතුය,

ඉහත වාර දෙක තුල දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතුය,

*සහ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/ කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම,

*හෝ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂයධාරාව තුළ ජෛව පද්ධති තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

***වැදගත්:-*** ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ විෂයයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.

*3.1.2 වයස :*

**2025.06.30** දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2007.06.30 දින හෝ ඊට පෙර හා 2000.06.30 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.2. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා -

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතුය,.

ඉහත වාර දෙක තුල දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ,

*සහ*

අයදුම්පත් කැඳවන අවසාන දිනට කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පහත සඳහන් කුමන හෝ පාඨමාලාවක් හදාරා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් ලබා දෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) සහතිකලාභියෙකු වීම.

- පැල තවාන් සංවර්ධන සහායක
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- උද්‍යාන අලංකරණ ශිල්පී
- භූ දර්ශන සංවර්ධන සහායක

*හෝ*

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ වෙනත් පාඨමාලාවක්.

*3.2.2 වයස :*

**2025.06.30** දිනට මෙම අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2007.06.30 දින හෝ ඊට පෙර හා 1990.06.30 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතු වලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල් වන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරා ගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

***04. විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :***

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරඟ විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිතව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී **2025 ඔක්තෝබර්** මාසය තුළ දී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදාළ අංකය ඇතුළත් කළ යුතුය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | අම්පාර |
| 2. | අනුරාධපුරය |
| 3. | දඹුල්ල |
| 4. | ගම්පහ |
| 5. | ගාල්ල |
| 6. | හම්බන්තොට |
| 7. | මහනුවර |
| 8. | කුරුණෑගල |
| 9. | වව්නියාව |

4.3 විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැති විට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

**5. පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :**

5.1 මෙම තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කළ යුතුය.

5.2 විභාග ගාස්තුව රු.1300.00 කි. මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අංක 057100139027201 දරන ආදායම් ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කළ දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය.

5.3 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුවේ. අයදුම්පත සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමඟින් 0812 388 340 හෝ 0812 388 341 යන දුරකථන අංකවලින් විමසීමක් කල හැක.

5.4 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

5.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2025.06.30 රාත්‍රී 12.00න්** පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.6 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කල අයදුම්පතේ දෘඪ පිටපතක් ලබා ගැනීම අනිවාර්ය වේ.

5.7 එසේ ලබාගත් දෘඪ පිටපතෙහි අයදුම්කරුගේ අත්සන යොදා පහත සඳහන් ඇමුණුම් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2025.07.04** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ – 5)" යන්න සඳහන් කළ යුතුය.

ඇමුණුම් :

අ. අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා :-

(i.) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්,
(ii.) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත,
(iii.) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්,
(iv.) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,
(v.) මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත.

ආ. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා අයදුම්පත් කැඳවන අවසාන දිනට සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා :-

(i.) අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්,
(ii.) ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතිකය,
(iii.) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්,
(iv.) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,
(v.) මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත.

නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී ප්‍රමාවන හෝ නැතිවන හෝ අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.8 5.7 හි සඳහන් ඇමුණුම් සහිත අයදුම්පතෙහි මුද්‍රිත පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

**06. අනන්‍යතාවය සනාථ කිරීම :**

6.1 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත්කල යුතුවේ.

(i.) ජාතික හැඳුනුම්පත,
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii.) වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය.

**07. විභාග ක්‍රමය :**

7.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුලත්ය. සෑම විෂයයක් සඳහාම ලකුණු 100 බැගින් ලබා දී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු 200න් කොපමණද වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

7.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

7.3 විෂය නිර්දේශය.

**කෘෂිකර්මය :** අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ මාදිලියේ ප්‍රශ්න අඩංගුවේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

බුද්ධි පරීක්ෂණය : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු වේ.

7.4 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඊට අදාළ ලදුපත ඇතුළුව 5.7 හි සඳහන් අනෙකුත් ඇමුණුම් සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මඟින් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම් දෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 081 2 388 085 හෝ 081 2388059 යන දුරකථන අංක වලින් විමසීමක් කල හැකිය.

7.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන විද්‍යුත් තැපැල් ලිපිනය, Whatsapp අංකය හා දුරකථන අංක බඳවා ගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

7.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරිය ලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජා පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරණ අයකු ලවා සහතික කර ගත යුතුය.

7.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

7.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කලහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.9 තරග විභාගයේ දී සිසුන් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැලකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහි දී අධ්‍යාපනික හා අදාළ අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණයවන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකට ම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

**08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

8.1 පාඨමාලාව සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි 10% ක ප්‍රමාණය ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

8.2 අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුලත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කරගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

8.3 යම් අයදුම්කරුවෙක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා කරනු ලබන අනියම්/අයුතු බලපෑම් ඔහු/ඇය පාඨමාලාවට ඇතුලත් කර ගැනීම සඳහා නුසුදුස්සෙක් වීමට හේතු වේ.

8.4 පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයන්ට අනුයුක්ත කිරීමෙන් පසු ඔවුන්ට කෘෂිකර්ම විද්‍යාල අතර මාරු වීම් සිදු කල නොහැක.

8.5 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව හැර යන්නේ නම් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

8.6 බඳවා ගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

8.7 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ඊ. ආර්. එස්. පී. එදිරිමාන්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 මැයි මස 14 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

05-193

---

**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මඟින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙහි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

**01. වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDPCT ) NVQ මට්ටම 05**

| | | |
|---|---|---|
| කාලසීමාව | - | අවුරුදු එකයි මාස හයයි.<br>අදියර I - අවුරුදු 01 ක පූර්ණ කාලීන/අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාව<br>අදියර II - මාස 06 ක ප්‍රායෝගික පුහුණුව |
| මාධ්‍යය | - | ඉංග්‍රීසි/සිංහල |
| පාඨමාලා ගාස්තුව | - | රු. 150,000.00 |

ඇතුළත් වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ.පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයන් තුනක් (03) සමත්වීම,

*හෝ*

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**අයදුම් කරන ආකාරය :**

මෙම පාඨමාලාව සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 ජුනි මස 13 වැනි දිනට** හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතිය අනුව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට එවිය යුතු අතර ඉල්ලුම් කරන පාඨමාලාව ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා - 011-2770232, 070-3455785, 077-6441028

05-221

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනයෙහි, පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම

බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ක්‍රියාත්මකවන ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනයට 2025 දෙවන අර්ධ වර්ෂය සඳහා නව ආධුනිකයින් දැන් බඳවා ගැනේ.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | : | 2025 ජුනි |
| අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය | : | 2025 ජුනි 14 |
| දුරකථන අංක | : | 011 2072850<br>071 0318720, 0779078190, 0711315005, 0713189401 |
| විද්‍යුත් ලිපිනය | : | koreantech@vtasl.gov.lk |
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය | : | සහකාර අධ්‍යක්ෂ<br>ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනය<br>බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. |

**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලාව* | *පූර්ණකාලීන පුහුණු කාලය (කර්මාන්තගත පුහුණු කාලය සමග)* |
|---|---|---|
| 01 | National Diploma in Automobile Technology<br>(මෝටර් රථ තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 02 | National Diploma in CNC Manufacturing Technology<br>(නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව - CNC -NVQ V) | 24 Months<br>මාස 24 |
| 03 | National Diploma in Electrical Technology<br>(විදුලි තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 04 | National Diploma in Fluid Power Technology<br>(තරල බල තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව - NVQ V) | 24 Months<br>මාස 24 |
| 05 | National Diploma in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 06 | National Diploma in Welding Technology<br>(පෑස්සුම් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 07 | National Diploma in Refrigeration & Air-conditioning Technology<br>(ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 08 | Automation & Robotics Technology (NVQ 6)<br>ස්වයංක්‍රීයකරණය සහ රොබෝ තාක්ෂණය | 36 Months<br>මාස 36 |
| 09 | Electronic Technology - (NVQ 6)<br>ඉලෙක්ට්‍රොනික තාක්ෂණය | 36 Months<br>මාස 36 |
| 10 | National Certificate in Automobile Painter<br>මෝටර් රථ පින්තාරු කිරීමේ ජාතික සහතිකය - (NVQ IV) | 12 Months<br>මාස 12 |

| අනු. අංකය | පාඨමාලාව | පූර්ණකාලීන පුහුණු කාලය (කර්මාන්තගත පුහුණු කාලය සමග) |
|---|---|---|
| 11 | National Certificate in Baker<br>බේකරි ජාතික සහතිකය - (NVQ IV) | 12 Months<br>මාස 12 |
| 12 | Quick Service Restaurant (QSR) - (NVQ V) | 04 Months<br>මාස 04 |

පූර්ණකාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීම විවෘත තරග විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආපසු නොගෙවන රුපියල් 500/- ක මුදලක් විභාග ගාස්තු ලෙස ගෙවා එහි රිසිට් පත ආදර්ශ අයදුම්පත සමග එවිය යුතුයි.

**පාඨමාලා ගාස්තු -** සියලු පාඨමාලා සඳහා අයකෙරේ (කොන්දේසි සහිතයි)

විභාග ගාස්තු ගෙවිය යුතු තොරතුරු පහත පරිදි වේ.
Account Name - Vocational Training Authority of Sri Lanka
Account No. - 071100140004520
Bank/Branch - People's Bank, Dematagoda

අර්ධකාලීන පාඨමාලා :

| අනු. අංකය | Course/ පාඨමාලාව | NVQ/Non | Duration කාලය |
|---|---|---|---|
| 01 | National Diploma in CNC Manufacturing Technology<br>(නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව -CNC) | NVQ V | 16 Months<br>මාස 16 |
| 02 | National Diploma in Electrical Technology<br>(විදුලි තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 03 | National Diploma in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 04 | National Diploma in Refrigerator & Air-condition Technology<br>(ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 05 | National certificate in Electrician<br>විදුලි කාර්මික ශිල්පී පිළිබඳ ජාතික සහතිකය | NVQ IV | 800 hrs. |
| 06 | National Certificate in Machinist (CNC Milling & Lathe)<br>යන්ත්‍ර ශිල්පී ජාතික සහතිකය (CNC Milling & Lathe) | NVQ IV | 760 hrs |
| 07 | National Certificate in Welding<br>පෑස්සුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය | NVQ IV | 800 hrs. |
| 08 | National Certificate in ICT Technician<br>තොරතුරු තාක්ෂණ ශිල්පී ජාතික සහතිකය | NVQ IV | 350 hrs. |
| 09 | Industrial Electronic Technician<br>කර්මාන්තගත ඉලෙක්ට්‍රොනික කාර්මික ශිල්පී | Non | 150 hrs. |
| 10 | National Certificate in Welding Technology<br>(පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය) | NVQ III | 450 hrs. |

| අනු. අංකය | *Course/ පාඨමාලාව* | *NVQ/Non* | *Duration* කාලය |
|---|---|---|---|
| 11 | Basic of Pneumatics and Hydraulics<br>වායු විද්‍යාව සහ හයිඩ්‍රොලික්ස් මූලිකාංග | Non | 150 hrs. |
| 12 | Computer Aided Drafting and Design 2D - CAD using Auto CAD<br>Auto CAD භාවිතයෙන් පරිගණක ආධාරක කෙටුම්පත් කිරීම සහ 2D - CAD නිර්මාණය කිරීම | Non | 150 hrs. |
| 13 | Computer Aided Drafting and Design 3D - CAD using Auto CAD<br>Auto CAD භාවිතයෙන් පරිගණක ආධාරක කෙටුම්පත් කිරීම සහ 3D - CAD නිර්මාණය කිරීම | Non | 80 hrs. |
| 14 | Robotics Basic Programming - රොබෝ තාක්ෂණය මූලික වැඩසටහන්කරණය | Non | 150 hrs. |
| 15 | Certificate in Single Phase Electrical Installation<br>එකලා විදුලි පරිපථ ස්ථාපනය | Non | 100 hrs. |
| 16 | Certificate in TIG welding | Non | 100 hrs. |
| 17 | Certificate in Solid Work Essentials | Non | 100 hrs. |
| 18 | Certificate in Programmable Logic Control (PLC) Programming | Non | 70 hrs. |
| 19 | Certificate in Refrigeration & Air Conditioning | Non | 120 hrs. |
| 20 | FCA Welding | Non | 60 hrs. |
| 21 | Advance Applied Office Automation | Non | 60 hrs. |
| 22 | Care Giver - වැඩිහිටි සත්කාරක ජාතික සහතිකය | Non | 360 hrs. |
| 23 | Japanese Language - ජපන් භාෂාව | Non | 200 hrs. |
| 24 | Automobile Painter - මෝටර් රථ වාහන පින්තාරුව | Non | 100 hrs. |
| 25 | Korean Language - කොරියානු භාෂාව | Non | 150 hrs. |
| 26 | Bread & Bun | Non | 278 hrs. |
| 27 | Certificate in Industrial Electrical Installation | Non | 250 hrs. |
| 28 | Special Programme for A/L Technology Student | Non | 150 hrs. |
| 29 | National Certificate in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්‍ෂණය පිළිබඳ සහතිකය) | NVQ IV | 760 hrs. |

| පාඨමාලා සහ ඇතුලත්වීමේ සුදුසුකම් : | |
|---|---|
| Course & Entry Qualification<br>Automation and Robotics Technology - (NVQ 6)<br>0715415524 (Mr. Ravi)<br>Electronic Technology - (NVQ 6)<br>0718508477 - (Mr. Bandara)<br>Automobile Technology - (NVQ 5)<br>0717649610 (Mr. Saman), 0763517398 (Mr. Nishan)<br><br>National Diploma in CNC Technology - NVQ V<br>0707576633 (Mr. Udaya), 0755149261 (Mr. Harsha)<br><br>National Diploma in Electrical Technology - NVQ V<br>071-1021388 (Mrs. Thushari), 0764265999 (Mr. Chamara)<br><br>National Diploma in Fluid Power Technology - NVQ V<br>077-8513634 (Mr. Sanjeewa), 0741977877 (Mr. Gihan)<br><br>National Diploma in Mechatronic Technology - NVQ V<br>071-9078560 (Mr. Sudath), 0711766561 (Ms. Nawodane)<br><br>National Diploma in Welding Technology - NVQ V<br>0718344878 (Mr. Anura),<br><br>National Diploma in Refrigerator & Air-Condition Technology - NVQ V<br>070-3127779 (Mr. Gayan), 0711925685 (Mr. Buddhika) | 3 passes for G. C. E. (A./L) Mathematics/ Engineering Technology with O/L English;<br>or<br>Art Stream with Credit pass for Hard Technology (Mathematical Technology, Electronic Electrical & Information Technology with O/L English;<br>or<br>NVQ Level 4 (Relevant Field) with O/L English & Mathematics with one pass G. C. E. (A/L) Mathematics/ETEC and O/L English conditional<br><br>අ. පො. ස. (උ. පෙළ) ගණිතය/ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා සාමාර්ථ 3ක් සමග අ. පො. ස. (සා.පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය; හෝ<br>දෘඩ තාක්ෂණය සඳහා සාමාර්ථ සහිත කලා විෂයයන් (ගණිත තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යුත් සහ තොරතුරු තාක්ෂණය) සමග සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි; හෝ<br><br>NVQ 4 මට්ටම (අදාළ විෂයය ක්ෂේත්‍රය) සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සහ ගණිතය;<br>හෝ<br><br>අ.පො.ස. (උ.පෙළ) ගණිතය/ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් එක් විෂයක් සමත්වීම හා අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි (කොන්දේසි සහිත). |
| **National Certificate in Automobile Painter**<br>**077-8156683 (Mr. Uthpala)**<br>**National Certificate in Baker**<br>**077-3349969 (Ms. Mawuly)**<br>**Quick Service Restaurant (QSR)**<br>**078-8533423 (Ms. Saduni)** | passes for G. C.E. (O/L)<br>or<br>pass grade 9<br><br>අ. පො. ස. (සා. පෙළ) සමත්<br>හෝ 9 වසර මට්ටම |

අර්ධකාලීන පාඨමාලා

පාඨමාලා සහ ඇතුළත්වීමේ සුදුසුකම් :

Course & Entry Qualification :

| Course | Entry Qualification |
|---|---|
| National Diploma in CNC Technology - NVQ V<br>National Diploma in Mechatronic Technology - NVQ V<br>National Diploma in Refrigerator & Air - condition Technology - NVQ V | අදාළ ක්ෂේත්‍රයේ මට්ටම සමඟ වසරක පළපුරුද්දක් හෝ අදාළ වෘත්තියේ වසරකට නොඅඩු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා තිබීම හා වසර දෙකක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද. |

NVQ 3 or 4 in the relevant field or two years' experience in the relevant field after identifying a full time program of not less than one year in the relevant profession

| Course | Entry Qualification |
|---|---|
| National Certificate in Electrician (industry)<br>National Certificate in Pneumatic Technician<br>National Certificate in Machinist (CNC Milling &Lathe)<br>National Certificate in Welding<br>National Certificate in ICT Technician<br>National Certificate in Draft Person<br>National Certificate in Computer Application Assistant | G. C. E. (O/L) විෂයයන් හයක් සමත්වීම<br>06 Passes for G. C. E. (O/L) |
| Industrial Electronic Technician<br>Robotics Basic Programming | ගණිතය සහ විද්‍යාව සමඟ G. C. E. (O/L) විෂයයන් 06ක් සමත්වීම, 06 passes for G. C. E. (O/L) with credit pass for mathematics & Science |

Certificate in Pneumatics and Hydraulics- අ.පො.ස. (සා. පෙළ) සමත්වීම, Pass G.C.E. (O/L)

Certificate in English Language - සැමට විවෘතයි, Open for all

Certificate in Computer Aided Drafting and Design 2D - CAD using Auto CAD - තොරතුරු තාක්ෂණ මූලික දැනුම

Basic Knowledge of ICT

**Ministry of Skills Development and Vocational Training**
Sri Lanka Korea National Vocational Training Institute
**K-TEC**
**Registration of Student for the Academic Year – 2025**

| **Student Personal Information** | | **Full Time** | | **Week End** | | **Evening** |
|---|---|---|---|---|---|---|

| | |
|---|---|
| Name with Initials: | |
| Full Name in Capital Letters: | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Date of Birth | D | M | Y | Age on the Date of Registration: | Years | Months | Days |
| | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| National ID No. | | Sex | F | | M | | Marital Status | Single | Married |
| | | | | | | | | | |

| | | | |
|---|---|---|---|
| Permanent Address | | | |
| Contact Numbers | Residence: | Mobile: | E-Mail: |
| Residential District | | | |

| **Course Information** | | | | |
|---|---|---|---|---|
| Name of the Preferred Course | 1.<br>2.<br>3. | | | |
| Entry Level Qualification | NVQ Stream | | **G.C.E. (A/L) Stream** | |

| **Education Details** | |
|---|---|
| Name of the School last attended | |

| Highest Examination passed | Year 10 | | G.C.E. (O/L) | | G.C.E. (A/L) | | Other | |
|---|---|---|---|---|---|---|---|---|

| G.C.E. (O/L) | | | | | | G.C.E. (A/L) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Index No. | | | Year | | | Index No. | | | Year | | |
| Subject | | Result | Subject | | Result | Subject | | Result | Subject | | Result |
| 1 | | | 5 | | | 1 | | | 5 | | |
| 2 | | | 6 | | | 2 | | | 6 | | |
| 3 | | | 7 | | | 3 | | | 7 | | |
| 4 | | | 8 | | | 4 | | | 8 | | |

| **Student with NVQ Level 4 Qualification** | | | | |
|---|---|---|---|---|
| Occupational Name of the Qualification/Course Name | | | Qualification Code | |
| Effective date of Qualification | | | | |
| Mode of Assessment | RPL | Yes/No | Accredited Course | Yes/No |
| If Accredited Course, Name of the Training Centre | | | | |

I, do hereby certify that the information furnished above is true and correct and conform to the entry qualifications indicated in the advertisement and that I have not registered for any full time Degree or Diploma in a University or any other Government Academic Institutions in Sri Lanka.

……………………………………………., ............................................
Signature of applicant. Date

*Please paste the Bank slip here*

————————,
සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

05-191

## විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### විශ්වවිද්‍යාල පද්ධතියේ සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත (බාහිර) තරඟ විභාගය - 2025

සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ.

1. ‘ලේකම්’ යනුවෙන් අදහස් කරනුයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

2. සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුරු සඳහා බඳවා ගැනීම ඉහත කී ලිඛිත විභාගය මඟින් සිදු කෙරේ.

3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගය පවත්වනු ඇත.

4. මෙම *ගැසට්* නිවේදනය පළවන සිකුරාදා දිනට පසුව එළඹෙන සඳුදා දින සිට උක්ත සඳහන් විභාගය සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාර ගැනීම ආරම්භ කරනු ඇත.

5. **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2025 ජූනි මස 20** වැනි අතර අදාළ ලිඛිත විභාගය **2025 අගෝස්තු මස** පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කටයුතු සංවිධානය කරනු ඇත.

6. ලිඛිත විභාගය පැවැත්වෙන දිනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අපේක්ෂකයින් වෙත දන්වනු ඇත.

7. ලිඛිත විභාගයේ ප්‍රතිඵල අපේක්ෂකයින් වෙත පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

**සටහන:**

- මෙම ලිඛිත පරීක්ෂණයට අදාළ ලිපි ලේඛන සහ ඒ හා අදාළ වෙනත් ඕනෑම ලිපියක් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

- අවසන් දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීම නිසා ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් දරා ගත යුතුය.

**බඳවා ගැනීම සඳහා සුදුසුකම්:**

බඳවා ගැනීම සඳහාවන සාමාන්‍ය සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම ,
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම,
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

සුදුසුකම් - **සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පළමු හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව ප්‍රථම උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ආ) ප්‍රථම උපාධියක් සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් පරිපාලනය / කළමනාකරණය**පිළිබඳ පශ්චාත් උපාධියක් / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා සිටිය යුතුය.

**වයස:** වයස අවුරුදු විසි දෙකට (22) නොඅඩු සහ අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුය. (2003.06.20 දිනට හෝ ඊට පෙර හා 1995.06.20 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

**

- රාජ්‍ය / ව්‍යාපාර පරිපාලනය
- කළමනාකරණය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- නීතිය
- මූල්‍ය කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම් සහ කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය හෝ
- කළමනාකරණය / පරිපාලනය සැලකිය යුතු සංරචකයක් සහිත වෙනත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක්

**සුදුසුකම් - සහකාර ගණකාධිකාරී /සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුර**

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් II පරීක්ෂණයෙන් සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ;

*හෝ*

2.(අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය පිළිබඳ විශේෂවේදී ප්‍රථම උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයක / උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රථම උපාධියක් **සමඟ** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර්මධ්‍ය මට්ටමේ පරීක්ෂණයෙන් සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;

*හෝ*

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ හෝ එහි පූර්වගාමී ආයතනයක උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව ලබා තිබීම

සහ

(ආ) රජයේ / රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණය / විගණනය පිළිබඳ වසර (02) දෙකක පළපුරුද්ද.

**වයස :** වයස අවුරුදු විසි දෙකට ( 22) නොඅඩු සහ අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුය.(2003.06.20 දිනට හෝ ඊට පෙර හා 1995.06.20 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**<u>සුදුසුකම් පිළිබඳ සීමාවන්:</u>**

1. බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටිය අනුව යම් තනතුරු කාණ්ඩයක් සඳහා බාහිර කාණ්ඩය යටතේ හෝ අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නොමැත (2016.12.31ට පෙර විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ).

2. කිසියම් අභ්‍යන්තර අපේක්ෂකයකු යම් තනතුරක් සඳහා (සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක) බාහිර හා අභ්‍යන්තර යන කාණ්ඩ දෙක සඳහාම සුදුසුකම් ලබන්නේ නම් ඔහු /ඇය අභ්‍යන්තර පදනම යටතේ වාර දෙකක් (02) හා බාහිර පදනම යටතේ වාර දෙකක් (02) ලෙස එක් එක් තනතුර සඳහා වාර හතර (04) බැගින් ලිඛිත විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේය (2016.12.31ට පෙර විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ).

3. අවශ්‍ය සියලුම සුදුසුකම් *ගැසට් නිවේදනයේ* සඳහන් අවසන් දිනට පෙර ලබා තිබිය යුතුය.

4. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට පෙනී සිටීමට අවසර නොමැත.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

බඳවා ගැනීම් ලිඛිත විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා සිදු කරනු ඇත.

1. එක් එක් කාණ්ඩය යටතේවන සියලු අපේක්ෂකයින් පහත පරිදි අදාළ කාණ්ඩය සඳහාවන විෂය ක්ෂේත්‍ර ආවරණය කරන ලිඛිත විභාගයකින් සමත් වීම අවශ්‍ය වේ :

| *තනතුර* | *විෂය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු %* |
|---|---|---|---|
| සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී | 1. සාමාන්‍ය බුද්ධිය හා තර්කනය | 100 | 40 |
| | 2. කළමනාකරණ නිපුණතාව | 100 | 40 |
| | 3. ඉංග්‍රීසි භාෂාව | 100 | 40 |
| සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක | 1. සාමාන්‍ය බුද්ධිය හා තර්කනය | 100 | 40 |
| | 3. ඉංග්‍රීසි භාෂාව | 100 | 40 |
| | 4. ගණකාධිකරණය හා මූල්‍ය | 100 | 40 |

2. ලිඛිත විභාගයේ දී සාර්ථක වූ අයදුම්කරුවන් අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සඳහා ප්‍රමාණවත් ලේඛනගත සාක්ෂි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ප්‍රථම ව ඉදිරිපත් කළ යුතු වේ. එම සියලු සුදුසුකම් දැන්වීමෙ හි සඳහන් අවසන් දින වනවිට ලබා තිබිය යුතුය. කිසියම් අයදුම්කරුවකු දෙන ලද දිනයට ප්‍රථමව අයදුම්පතෙහි සඳහන් කරුණු සනාථ කිරීමට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. ලිඛිත විභාගය සාර්ථක වීම පත්වීමක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

3. ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා ලද සහ ඉහත (2) හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වන සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන් ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ඇත.

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයදුම්කරුවන් පත්වීමක් සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබනු ඇත.

5. ලිඛිත විභාගයේ (75%) හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ (25%) ලකුණු ප්‍රමාණයේ එකතුව මත කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කරනු ඇත.

6. බාහිර හා අභ්‍යන්තර කාණ්ඩ සඳහා වෙන් කරන ලද තනතුරු සංඛ්‍යාව මත පදනම් ව පුරප්පාඩු පැවතීම මත කුසලතා අනුපිළිවෙළ අනුව පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ.

**විභාග මාධ්‍යය:**

1. විභාගය භාෂාත්‍රයෙන් ම පවත්වනු ලැබේ (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි).

2. අපේක්ෂකයන් විසින් ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය හැර සියලු විභාග ප්‍රශ්න පත්‍ර සඳහා ඔහු /ඇය අයදුම්පතෙහි සඳහන් කළ භාෂා මාධ්‍යයෙන් පෙනී සිටිය යුතුය.

3. කිසිදු තත්ත්වයක් යටතේ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට කිසිදු අපේක්ෂකයකුට ඉඩ ලබා දෙනු නොලැබේ.

**<u>අයදුම් කිරීමේ ක්‍රමය සහ විභාග කොන්දේසි :</u>**

1. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත ගතයුතු වේ. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතු වේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   දැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

2. සෑම අයදුම්කරුවකු ම තමන් අයදුම් කිරීමට බලාපොරොත්තුවන සියලු තනතුරු සඳහන් කර එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය.

3. අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යය සඳහන් කිරීම **අත්‍යවශ්‍ය වේ.**

4. විභාග ගාස්තුව රු. 1200 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදුකළ යුතුය.

   - ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
   - අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
   - ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
   - ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

   **සටහන :**

   (අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

   (ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) පණිවිඩයක් මඟින් දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

   (ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

5. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මඟින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:** අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව ඕනෑම අවස්ථාවක එනම් විභාගයට පෙර, විභාග පවත්වන කාලයේ දී, විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක, අපේක්ෂකයකුගේ නුසුදුසුභාවය අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. අපේක්ෂකයකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් හෝ ඔහු / ඇය කිසියම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති බවට අනාවරණය වුවහොත් විශ්වවිද්‍යාල පද්ධතියේ සේවයෙන් එම පුද්ගලයා ඉවත් කරනු ඇත.

7. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම, තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

**සටහන:**
අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව:** විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කරගත හැකි පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

9. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු, ලිඛිත විභාගයේ (75%) හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ (25%) ලකුණු ප්‍රමාණයේ එකතුව මත අවසාන ප්‍රමුඛතා ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස්කර ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිකුත් කිරීමත් සමඟම ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබාගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

10. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවම වශයෙන් පරිවාස කාලය තුළ හෝ ඔහු / ඇය අනුයුක්ත කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

**මාසික වැටුප් පරිමාණය :**

මෙම තනතුර මාසිකව U-EX 1 (II), රු. **85,305 –3x2,020 – 91,365 (EB) 93,765; 12x 2,400 -** රු. **122,565** යන ඒකාබද්ධ වැටුප් පරිමාණය දරනු ඇත.

මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ඇත.

**පාරිතෝෂිකය:**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවනු ඇත.

**අර්ථසාධක අරමුදල හා විශ්‍රාම ප්‍රතිලාභ :**

සේවකයා විසින් වැටුපෙන් සියයට දහයක් (10%) ද, සේවා යෝජකයා විසින් වැටුපෙන් සියයට පහළොවකට සමාන මුදලක් (15%) ද බැර කරනු ඇති අතර, එයින් වැටුපෙන් සියයට අටක් (8%) විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට ද, සියයට හතක් (7%) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද සේවා යෝජකයා විසින් බැර කරනු ඇත.

**සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ :**

සේවා යෝජකයා විසින් වැටුපෙන් සියයට තුනකට සමාන මුදලක් (03%) බැර කරනු ඇත.

**ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය හා ප්‍රශ්න පත්‍ර:**

**සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *විස්තරය* |
|---|---|---|
| ප්‍රශ්න පත්‍රය 01<br>සාමාන්‍ය බුද්ධිය හා තර්කනය | පැය 1 ½ | අපේක්ෂකයාගේ තාර්කික අවබෝධය සහ විශ්ලේෂණ කුසලතාව හා අනුමාන කිරීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් කිරීමට සැලසුම් කර ඇත. ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත. |
| ප්‍රශ්න පත්‍රය 02<br>කළමනාකරණ නිපුණතාව | පැය 03 | පහත ක්ෂේත්‍ර හා අදාළව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කරනු ඇත. :-<br>• කළමනාකරණ චින්තනයේ පරිණාමය<br>• කළමනාකරණයේ කාර්යයන් (සැලසුම්කරණය,සංවිධානය, මාණ්ඩලිකරණය, මෙහෙයුම, අභිප්‍රේරණය, සන්නිවේදනය, පාලනය සහ ඇගයීම යනාදී ලෙස)<br>• කළමනාකරණයේ මෑත කාලීන සංවර්ධනය<br>• කළමනාකරණයේ ශිල්ප ක්‍රම |
| ප්‍රශ්න පත්‍රය 03<br>ඉංග්‍රීසි භාෂාව | පැය 1 ½ | පහත ක්ෂේත්‍ර හා අදාළව අපේක්ෂකයින්ගේ ව්‍යාකරණ හා ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ඇත.<br>• අවබෝධය<br>• ලිපි / මෙමෝ පත්‍රිකා/ සටහන් ලිවීමේ හැකියාව<br>• සිංහල/ දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම |

**සහකාර ගණකාධිකාරී /සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුර**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *විස්තරය* |
|---|---|---|
| ප්‍රශ්න පත්‍රය 01<br>සාමාන්‍ය බුද්ධිය හා තර්කනය | පැය 1 ½ | අපේක්ෂකයාගේ තාර්කික අවබෝධය සහ විශ්ලේෂණ කුසලතාව හා අනුමාන කිරීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් කිරීමට සැලසුම් කර ඇත. ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත. |
| ප්‍රශ්න පත්‍රය 03<br>ඉංග්‍රීසි භාෂාව | පැය 1 ½ | පහත ක්ෂේත්‍ර හා අදාළව අපේක්ෂකයින්ගේ ව්‍යාකරණ හා ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ඇත.<br>• අවබෝධය<br>• ලිපි / මෙමෝ පත්‍රිකා/ සටහන් ලිවීමේ හැකියාව<br>• සිංහල/ දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම |

| ප්‍රශ්න පත්‍රය | කාලය | විස්තරය |
|---|---|---|
| ප්‍රශ්න පත්‍රය 04<br>ගණකාධිකරණය හා මූල්‍ය | පැය 03 | පහත ක්ෂේත්‍ර හා අදාළව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කරනු ඇත.<br>• අවසන් ගිණුම් පිළියෙල කිරීම<br>• බැංකු සැසඳුම් ප්‍රකාශය<br>• තොග සත්‍යායනය<br>• ප්‍රසම්පාදන ක්‍රියාවලිය<br>• මුදල් ප්‍රවාහ ප්‍රකාශන<br>• විගණන ක්‍රියාවලිය |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ පරිපාටිය
සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරි (බාහිර කාණ්ඩය)

| | | ප්‍රතිශතය |
|---|---|---|
| 1 | අවම අවශ්‍යතාවට වඩා ඉහළින් ඇති අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | 20% |
| 2 | අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව | 10% |
| 3 | අදාළ පළපුරුද්ද | 10% |
| 4 | සම්මුඛ පරීක්ෂණ කුසලතාව | 40% |
| 5 | විෂය බාහිර ක්‍රියාකාරකම් සහ පෞරුෂය | 10% |
| 6 | නම් කරන ලද තීරකගේ වාර්තාව | 10% |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ පරිපාටිය
සහකාර ගණකාධිකාරි/සහකාර මූල්‍යාධිකාරි/සහකාර අභ්‍යන්තර විගණක (බාහිර කාණ්ඩය)

| | | |
|---|---|---|
| 1 | අවම අවශ්‍යතාවට වඩා ඉහළින් ඇති අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | 20% |
| 2 | අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව | 10% |
| 3 | අදාළ පළපුරුද්ද | 10% |
| 4 | සම්මුඛ පරීක්ෂණ කුසලතාව | 40% |
| 5 | විෂය බාහිර ක්‍රියාකාරකම් සහ පෞරුෂය | 10% |
| 6 | නම් කරන ලද තීරකගේ වාර්තාව | 10% |

නිවේදනය පළ කිරීම

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2025 මැයි මස 30 වැනි දින.

05-231

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2025 ජූලි මස** මහනුවර දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටින තුන්වන ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විෂය නිර්දේශ : I වන කාර්යක්ෂමතා කඩඉම පාලනය කරන විෂය නිර්දේශය හා අනෙකුත් විධි විධාන 2013.12.13 දිනැති අංක 1840/51 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. මෙම සේවාවේ නිලධාරින් I වන කාර්යක්ෂමතා කඩඉම සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

| *ප්‍රශ්න පත්‍රය* | | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | | | |
| 01 | මූල්‍ය ක්‍රම | පැය 02 | 100 | 40 |
| 02 | පරිපාලනය | පැය 02 | 100 | 40 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | පැය 02 | 100 | 40 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | පැය 03 | 100 | 40 |

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | | *විෂය නිර්දේශය* |
|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | |
| 01 | මූල්‍ය ක්‍රම | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (x වන පරිච්ඡේදය හැර) |
| 02 | පරිපාලනය | (අ) කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා කාර්යාල සංවිධානය කිරීම පිළිබඳ දැනුම<br>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතින්හි I – XXII දක්වා වූ පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XXIII, XXV, XXVI,XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | සත්ත්ව පනත, සත්ත්ව රෝග පනත හා ආනුෂංගික රීති, දෙපාර්තමේන්තුවේ නියෝග සහ පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ |

| ප්‍රශ්න පත්‍රයේ නම | | විෂය නිර්දේශය |
|---|---|---|
| විෂය අංකය | විෂයය | |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | (අ) නිදර්ශක බෙදා හැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව<br>(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝ කිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බිජෞෂණය මගින් පැටවුන් ලබා ගැනීම හා ඇතිදැඩි කිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය<br>(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන්කිරීම, බටර් ගිතෙල් හා මීකිරි නිෂ්පාදනය<br>(ඈ) ඝාතනාගාරවල දී සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම |

05. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් මහනුවර දී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ. අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින් ම පැහැදිලිව කළ යුතු වේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

07. අංක 2422/49 හා 2025.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 04 ප්‍රකාරව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර **2025.06.20** දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

09. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතුය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම්

ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

10. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

11. ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සලකා බලනු නොලැබේ.

12. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. මෙම විභාගයට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | |
|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා - | රු. |
| සම්පූර්ණ විභාගය සඳහා | 1,200. 00 |
| එක් විෂයයකට | 300. 00 |

මෙම විභාගයට මීට පෙර අයදුම් කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2003 – 99 – 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් හෝ ඇත්නම් එහිදී සිංහල නිවේදනය බලාත්මක වේ.

ආචාර්ය. කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2025 මැයි මස 21 වැනි දින.

**ආදර්ශ අයදුම් පත**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.**
**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන**
**පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

**THE FIRST EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE –2025**

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)
නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(උදා: GUNAWARDHANA H.M.S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. (i) ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) කාර්යාලීය ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**05**. ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. නිවේදනයේ 04 වන ඡේදයේ දක්වා ඇති, විෂයය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් : (පැහැදිලිව සඳහන් කළ යුතුය.)

| ***විෂයය*** | ***විෂයය අංකය*** |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

.................................................................................................................................................

08. උපන්දිනය :

| වර්ෂය : | | | | | මාසය: | | | දිනය: | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

09. පදවි නාමය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
දෙපාර්තමේන්තුවේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය : . . . . . . . . . . . . . . . . . . . .

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට හා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු.......................................

ගෙවන ලද කාර්යාලය : ........................................ ලදුපත් අංකය : ........................................

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

දිනය : .................................... අපේක්ෂකයාගේ අත්සන : .................................

............................................. මගින්,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

......................................................................

දිනය : ........................................ ආයතන ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය.

(* ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය) (නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් කළ යුතුය.)**

05-222

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2025 ජූලි මස මහනුවර** දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විෂය නිර්දේශ - II වන කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ හා අනෙකුත් විධිවිධාන 2013.12.13 දිනැති අංක 1840/51 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. මෙම සේවාවේ නිලධාරීන් II වන කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය අංකය* | *විෂය / විෂය නිර්දේශයේ කොටස් (සේවා ව්‍යවස්ථාවේ 4 පරිශිෂ්ටයේ අංක 5 හි දක්වා ඇති පරිදි )* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 කොටස | 01 | විෂයය නිර්දේශයේ 2:1, 2:2, 4:1, 4:2, 5:2, 5:8, 6:5, 7:2:1, 8:2, 8:2:2, 8:2:3, 8:3:1, 9:2, 9:4, 9:6, 9:7 කොටස් | පැය 03 | 100 | 40 |
| **හෝ** | | | | | |
| 2 කොටස | 02 | විෂය නිර්දේශයේ 1:1:1, 1:1:4, 1:2:1, 3:2, 3:1:1, 3:1:2, 3:2:1, 10:1:1, 10:1:2, 10:1:3, 10:1:4, 10:1:6, 10:2:1, 10:2:8 හා 10:4:1 කොටස් | පැය 03 | 100 | 40 |
| **සහ** | | | | | |
| 3 කොටස | 3 කොටසින් පත්‍ර 2 කට පිළිතුරු සැපයිය යුතු වේ | | | | |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය අංකය* | *විෂය / විෂය නිර්දේශයේ කොටස් (සේවා ව්‍යවස්ථාවේ 4 පරිශිෂ්ටයේ අංක 5 හි දක්වා ඇති පරිදි )* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 පත්‍රය | 03 - 1 | ව්‍යාධි විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 2 පත්‍රය | 03 - 2 | පශු සම්පත් ආර්ථික විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 3 පත්‍රය | 03 - 3 | පශු මහජන සෞඛ්‍ය | පැය 03 | 100 | 40 |
| 4 පත්‍රය | 03 - 4 | කෘෂි ව්‍යාප්තිය | පැය 03 | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රය | විෂය අංකය | විෂය / විෂය නිර්දේශයේ කොටස් (සේවා ව්‍යවස්ථාවේ 4 පරිශිෂ්ටයේ අංක 5 හි දක්වා ඇති පරිදි ) | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 5 පත්‍රය | 03 - 5 | ජාන විද්‍යාව හා අභිජනනය | පැය 03 | 100 | 40 |
| 6 පත්‍රය | 03 - 6 | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය | පැය 03 | 100 | 40 |
| 7 පත්‍රය | 03 - 7 | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය | පැය 03 | 100 | 40 |
| 8 පත්‍රය | 03 - 8 | සත්ත්ව පෝෂණය | පැය 03 | 100 | 40 |
| 9 පත්‍රය | 03 - 9 | තෘණ හා ගෝචර තෘණ | පැය 03 | 100 | 40 |
| 10 පත්‍රය | 03 -10 | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීවී විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 11 පත්‍රය | 03 -11 | ව්‍යවහාරික , වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය | පැය 03 | 100 | 40 |

*04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

2013.12.13 දිනැති අංක 1840/51 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ හතරවන පරිශිෂ්ඨයෙහි අංක 05 යටතේ වන විෂය නිර්දේශය මේ සඳහා අදාළ වේ.

05. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් මහනුවර දී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින් ම පැහැදිලිව කළ යුතු වේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

07. අංක 2422/49 හා 2025.02.07 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 04 ප්‍රකාරව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. අයදුම් පත්‍ර **2025.06.20** දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතුය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

10. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

11. ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සලකා බලනු නොලැබේ.

12. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. මෙම විභාගයට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණයකර ඇත.

(අ) ප්‍රථම වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | |
|---|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා | රු. | ශත |
| සම්පූර්ණ විභාගය සඳහා | 1200 | . 00 |
| එක් විෂයකට | 400 | .00 |

මෙම විභාගයට මීට පෙර අයදුම් කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2003 – 99 – 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ආචාර්ය. කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා.

2025 මැයි මස 21 වැනි දින.

ආදර්ශ අයදුම්පත

**කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන**
**දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025.**

**THE SECOND EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE – 2025.**

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)
නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(උදා: GUNAWARDHANA H.M.S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. (i) ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) කාර්යාලීය ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

**05**. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

06. නිවේදනයේ 04 වන ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතුය.)

| **විෂයය** | **විෂය අංකය** |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

..........................................................................................................................................................

08. උපන්දිනය :

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

09. පදවි නාමය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
දෙපාර්තමේන්තුවේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය : . . . . . . . . . . . . . . . . . . . .

11. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට උසස් කරන ලද දිනය : . . . . . . . . . . . . . . . . . . . .

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට හා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු.......................................

ගෙවන ලද කාර්යාලය : ........................................ ලදුපත් අංකය : ..........................................

| |
|---|
| |

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

දිනය : .................................... අපේක්ෂකයාගේ අත්සන : .................................

............................................. මගින්,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

දිනය ....................................... දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය
(* ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය) (නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
**(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් කළ යුතුය.)**

**05-223**

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023,2024 හා 2025 වර්ෂයන්ට අදාළව පොදුවේ එක් විභාගයක් ලෙස **2025 ජූලි මස මහනුවර දී** පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - 2013.12.13 දිනැති අංක 1840/51 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

**විභාගය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහාවන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් කිරීමේ දී ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින් ම පැහැදිලිව කළ යුතු වේ.

06. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව උක්ත සඳහන් විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර **2025 ජූනි මස 20** වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානි මාර්ගයෙන් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා කිසිදු විභාග ගාස්තුවක් අය නොකෙරේ. එතකුදු වුව ද දෙවන වර හෝ ඊට වැඩි වාර ගණනක් පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ගාස්තු ලෙස රු.600/= ක් ගෙවිය යුතුවේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2003 – 99 – 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිඳු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

10. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතුය. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

11. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපතක් සහ අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සළකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපතිවරයා වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. ඉල්ලුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ආචාර්ය. කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2025 මැයි මස 21 වැනි දින

**ආදර්ශ අයදුම්පත**

**කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන**
**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**
**THE THIRD EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE – 2025**

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය)

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කල යුතුය)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(උදා: GUNAWARDHANAH.M.S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. (i) ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) කාර්යාලීය ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**05**. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

..............................................................................................................................................

07. උපන්දිනය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වර්ෂය** | | | | | **මාසය** | | | **දිනය** | | |

08. පදවි නාමය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. දෙපාර්තමේන්තුවේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියට උසස් කරන ලද දිනය : . . . . . . . . . . . . . . . . . . . .

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටිමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට හා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු.......................................

ගෙවන ලද කාර්යාලය : ........................................ රිසිට්පත් අංකය : .........................................

| |
|---|
| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

දිනය : .................................... අපේක්ෂකයාගේ අත්සන : .................................

.............................................. මගින්,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

දිනය ........................................ ආයතන ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය

(* ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය) (නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් කළ යුතුය.)**

05-224

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරෙහි III ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මඟින් බඳවා ගැනීම් සිදු කරනුයේ උපදේශක III ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

1. සාමාන්‍ය දැනීම
2. බුද්ධි පරීක්ෂණය

02. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 08 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**03. සේවා කොන්දේසි :**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST /04-01-43/02/2016 හා 2017.09.12 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 හා 2022.12.14 දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත් ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු මෙම සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

3.3 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදේශක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 භාෂා ප්‍රවීණතාවය :

රාජ්‍ය භාෂාව - රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

අනෙක් රාජ්‍ය භාෂාව - රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 18/2020 සහ අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාට බලය ඇත.

**04. මාසික වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. **52,250-10x 800-11 x 1190 - 10 x 1320 - 10 x 1350 - 100,040 (MN - 3-2025) වේ.**
ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍ර ලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**05. බඳවා ගැනීමේ සුදුසුකම් :**

*(අ)* (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*(ආ)* **අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

*(ඇ)* **වෘත්තීය සුදුසුකම් :**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q.) පහ (05) හෝ (06) මට්ටමේ යාන්ත්‍රික, විදුලි හෝ මෙකාට්‍රොනික් ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම.

*(ඈ)* **පළපුරුද්ද**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක ඉගැන්වීමේ සහ / හෝ ප්‍රායෝගික පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*(ඉ)* **වයස :** අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු
උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

06.1 ලිඛිත විභාගය

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *කාලය* | *සමත් වීමට ලැබිය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 100 | පැය 01 | 40 |
| 02. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 | 40 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

**6.1.1 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :**

*01. සාමාන්‍ය දැනීම*
ආර්ථික, සමාජීය, දේශපාලනික, භූගෝලීය හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුළ ඇති දැනුම පිරික්සීම සඳහා සැකසූ ප්‍රශ්න පත්‍රයකි.

02. බුද්ධි පරීක්ෂණය :
තර්කණ ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාවය පරීක්ෂා කරනු ලැබේ.

***06.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :***

මෙම නිවේදනයේ 6.1 ඡේදය අනුව ලිඛිත තරග විභාගයට පෙනී සිට සමත්වන අයදුම්කරුවන්ගෙන් ඉහළම කුසලතා දැක්වූ අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන සංඛ්‍යාවක් තෝරා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු සියයකි. (100)

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| පළපුරුද්ද | 40 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක හැකියාව | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 |
| වෘත්තීය පරීක්ෂණය | 25 |
| මුළු ලකුණු | 100 |

*06.3 එහි විස්තරාත්මක ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ. :*

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍රයේ | සලකා බලන උපක්ෂේත්‍රයේ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ඩිප්ලෝමා/ උපාධිය/ පශ්චාත් උපාධිය/ වෙනත් ආදිය | ලකුණු 10 |
| පළපුරුද්ද | අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක ඉගැන්වීමේ සහ / හෝ ප්‍රායෝගික පළපුරුද්දට අමතරව ලබා ඇති ඉගැන්වීමේ සහ ප්‍රායෝගික පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 08 ක් සඳහා | ලකුණු 40 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව හා පරිගණක හැකියාව | ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව හා/ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා ලකුණු 05-<br>හදාරා ඇති පරිගණක පාඨමාලා අනුව උපරිම ලකුණු 05 ක් දක්වා | ලකුණු 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | පෞරුෂය සහ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ආකාරය | ලකුණු 05 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | වෘත්තියට අදාළව හදාරා ඇති අතිරේක වෘත්තීය පාඨමාලා සහ පුහුණුවීම් | ලකුණු 10 |

දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණය

<table>
<tr><th colspan="2">ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර</th><th>ලබාදෙන ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td colspan="2">1. දේශන සටහන් පිළියෙල කිරීම</td><td>ලකුණු 07</td><td rowspan="4">10</td></tr>
<tr><td colspan="2">2. ඉදිරිපත් කිරීම</td><td>ලකුණු 18</td></tr>
<tr><td>I.</td><td>පිවිසුම</td><td>ලකුණු 03</td></tr>
<tr><td>II.</td><td>දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම</td><td>ලකුණු 03</td></tr>
</table>

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | | ලබාදෙන ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| III. | ඉදිරිපත් කිරීමේ විලාශය | ලකුණු 05 | 10 |
| IV. | විෂයය අන්තර්ගතය | ලකුණු 04 | |
| V. | කාල කළමනාකරණය | ලකුණු 03 | |

*සැලකිය යුතු යි.* :- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

*6.4 විභාගය සමත් සියලු අයදුම්කරුවන්ගේ නාමලේඛනය දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.*

**07. විභාග ගාස්තු :**

ගාස්තුව රු. 1,000/- කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-**

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 5.0 තෙක් දෙවන පිටුවට ද, 6.0 සිට 7.0 තෙක් ශීර්ෂ එහි තෙවන පිටුවට ද ඇතුළත් වන සේ තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකි ය.

*(ආ)* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් තම අත් අකුරෙන් ම විභාග අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදිය යුතු ය. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

*(ඇ)* නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025.06.30 දිනට පෙර එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත් භාර ගනු නොලැබේ.

*(ඈ)* අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 746,760 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

*(ඉ)* සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

*(ඊ)* අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ

ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ පත්වීම් ශාඛාව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තරය සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් 011-2446490 දරන ෆැක්ස් අංකය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතුයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමට ද ප්‍රයෝජනවත් වනු ඇත.

**09. විභාගයට ඇතුළුවීම :**

*(අ)* *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* අයදුම්කරුවන් තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපත් වෙත භාර දිය යුතු ය. සෑම අයදුම්කරුවකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*(ඇ)* අත්සන සහතික කිරීම : “අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

සටහන - අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**10. අයදුම්කරුගේ අනන්‍යතාව:**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය

**11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:**

අයදුම්පතුය පිරවීමේ දී ඉතා සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බවට අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

**12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.**

**13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

(අ) විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන : (1) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(2) තම අයදුම්පත්‍රයෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජි. ජේ. අයි. ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 මැයි මස 23 වැනි දින,
තැ. පෙ. 355,
ඕල්කොට් මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි )

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල -1
දෙමළ -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ තරඟ විභාගය - 2025

2.0 පෞද්ගලික තොරතුරු

2.1 සම්පූර්ණ නම : ____________________
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා. (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම
(උදා. GUNAWARDHANA H. M.S.K.) : ____________________

2.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන් ) : ____________________

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) ____________________

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ____________________

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ -0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී -1

1.7 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.8 විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක -1
විවාහක -2

2.9 ජන වර්ගය : (සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ -3, මුස්ලිම් -4, වෙනත් -5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න )

2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.11 සුදුසුකම් සැපිරිය යුතු ............................ දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

2.12 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.1 අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (උ/පෙළ)
වර්ෂය - ............................. විභාගය අංකය : ..........................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | .................................................................... | ................................................................ |
| 2. | .................................................................... | ................................................................ |
| 3. | .................................................................... | ................................................................ |
| 4. | .................................................................... | ................................................................ |
| 5. | .................................................................... | ................................................................ |
| 6. | .................................................................... | ................................................................ |
| 7. | .................................................................... | ................................................................ |
| 8. | .................................................................... | ................................................................ |
| 9. | .................................................................... | ................................................................ |
| 10. | .................................................................... | ................................................................ |

අ. පො. ස. (උ/පෙළ)
වර්ෂය - ............................. විභාගය අංකය : ..........................

| | | |
|---|---|---|
| 1. | .................................................................... | ................................................................ |
| 2. | .................................................................... | ................................................................ |
| 3. | .................................................................... | ................................................................ |
| 4. | .................................................................... | ................................................................ |

3.2 වෘත්තීය සුදුසුකම් :
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

3.2 පලපුරුද්ද :
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

4.0 *විභාග ගාස්තු ගෙවීම :*
*විභාග ගාස්තු*

(i) ගෙවන ලද මහජන බැංකු ශාඛාව ..................................
(ii) ගෙවූ මුදල ............................
(iii) ගෙවූ දිනය .......................................

| |
|---|
| *ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.*<br>*(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.)* |

5.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුලත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පවත්වනු ලබන නීති රීති වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : *(ගැසට් නිවේදනයේ 8(ඈ) පරිදි විය යුතු ය. )*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත මෙහි අලවා ඇති බවත්, ...................... දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

...................................,
දිනය : ..................... සහතික කරන නිලධාරියාගේ අත්සන.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ...............................................
තනතුර : ...........................................
දිනය : ..................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය. )

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : *(රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි )*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................. මයා/මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................. ලෙස සේවය කරන අතර ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

...................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ...............................................
පදවි නාමය : ...........................................
දිනය : ..................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය. )

05-228

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක ( සිංහල/ දෙමළ)(සිංහල/ ඉංග්‍රීසි)(දෙමළ/ ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

02. සේවා කොන්දේසි :

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ භාෂණ පරිවර්තක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත්කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේය.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ ද්විතීක මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුලත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - (MN 2-2025)
වැටුප් පරිමාණය (මාසිකව) - රු.48,470/– 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 - රු.82,800/-

අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු.48,470/ක ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලබන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත්වන නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේය.

05. සුදුසුකම්:

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) 2025.05.30 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය යන විෂයයන් අතුරින් විෂයන් දෙකකට (02) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

*සහ*

(II) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එක්වර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(III) වෙනත් ජාත්‍යන්තර භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(ඉ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**සැ.යු -** සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025 මැයි මස 30 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. විභාග පටිපාටිය :-
විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03)යුක්ත වේ.

| | *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | 40 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | 40 |
| 03 | පරිවර්තනය | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන 'පරිවර්තනය' විෂයයේ සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් ''භාෂා හැකියාව'' හා ''අභියෝග්‍යතාව'' යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

'පරිවර්තනය' සඳහා තමන් අයදුම් කරන ගණයට අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම , දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 03 | පරිවර්තනය | සිංහල/ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි/සිංහල භාෂාවට |
| | | සිංහල /දෙමළ භාෂාවට<br>දෙමළ/සිංහල භාෂාවට |
| | | දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි /දෙමළ භාෂාවට |

***සටහන :*** සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩුකරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මගින් තැපෑලෙන් සිදු කරනු ඇත.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. විභාග ගාස්තු :

විභාග ගාස්තු රු. 400/- කි. මෙම මුදල ''අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්'' නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස්කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විභාගය සඳහාවන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2025 ජූනි මස 27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2025 ජූනි මස 27 වැනි දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඇ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටීම - ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මඟින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

13. විභාගයට ඇතුළත් වීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම ප්‍රවේශ පත්‍රයේ තබන අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 මැයි මස 23 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි)III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:
සිංහල - 1 [ ]
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. අයදුම්කරන භාෂණ පර්වර්තක තනතුර :

සිංහල/දෙමළ [ ]
සිංහල/ඉංග්‍රීසි
දෙමළ/ඉංග්‍රීසි
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

03. පෞද්ගලික තොරතුරු :
3.1 මුලකුරු සමඟ නම: Mr./Mrs./Miss. ........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

3.2 සම්පූර්ණ නම: ............................................................................................................................ ……
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

3.3 සම්පූර්ණ නම : ........................................................................................................................ ……...
(සිංහලෙන්/දෙමළෙන්)

3.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) : ..........................................................................................

3.5 පදිංචි දිස්ත්‍රික්කය : ....................................................................................................................................

3.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) : ....................................................................

3.7 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.8 උපන් දිනය :

වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

3.9 2025.05.30 දිනට වයස :

අවුරුදු : [ | | | ] මාස : [ | ] දින: [ | ]

3.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.12 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම:................................
විද්‍යුත් තැපැල:...............................

04. අධ්‍යාපන සුදුසුකම්:

4.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර:
(අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

(1) විභාගයේ වර්ෂය හා මාසය : .........
(2) විභාග අංකය: ..............................
(3) ප්‍රතිඵල: ......................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

(1) විභාගයේ වර්ෂය හා මාසය :...........
(2) විභාග අංකය:................................
(3) ප්‍රතිඵල:.......................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

4.3 වෙනත් ජාත්‍යන්තර භාෂා දැනීම සම්බන්ධයෙන් ඇති සුදුසුකම් :

| *ජාත්‍යන්තර භාෂාව* | *සුදුසුකම* | *සුදුසුකම ලබාගත් ආයතන* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

05. වෙනත් සුදුසුකම්: ..............................................................................................................................................
.................................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න : ......................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:

විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව: .......................

ලදුපත් අංකය හා දිනය : ................................

ගෙවූ මුදල: ...................................................

*ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.*
*(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකි ය.*

08. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................. ......................................................................
දිනය. අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන .................................. දින තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

...................... .............................................................
දිනය. අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.......................................................................
තනතුර :.........................................................................
ලිපිනය :.........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)**

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන .......................... තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2025.05.30 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... දින අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-
නිල මුද්‍රාව :-

05-239